www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධය එහි අවසානය කරා ලඟාවෙද්දී ආන්ඩුව වාර්ගික උන්මාදය අවුලුවාලයි

## Sri Lankan government whips up communal hysteria as war reaches climax

**විජේ ඩයස් විසිනි**

**2009 මැයි 8**

ශ්‍රී ලංකාවේ යුද්ධය එහි අවසන් අදියරයන්ට එලඹෙමින් තිබියදී කොලඹ සමස්ත මාධ්‍ය හා දේශපාලන සංස්ථාපිතය විසින් අවුලුවාලන වාර්ගික උත්සන්නිය, එහි උච්ඡ අවස්ථාවට නංවා තිබේ. එහි අරමුන වී ඇත්තේ ආන්ඩුව, සමස්ත වැඩ කරන ජනතාවට ම එරෙහිව ආර්ථික ප්‍රහාරයකට සූදානම් වෙමින් සිටිය දී, දෙමල ජනතාවට එරෙහි එහි අපරාධ පිලිබඳ කුමන විවේචනයක් හෝ විරුද්ධත්වයක් මැඩ පැවැත්වීමයි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ එල්ටීටීඊයට විරුද්ධ සිය වාර්ගික යුද්ධය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ව්‍යාජ වහන්තරාව යටතේ යුක්තිසහගත කරයි. ත්‍රස්තවාදයට එරෙහිව සටන් වැදීමේ මුවාවෙන් රට යුද සූදානමක තබා ඇත. ආන්ඩුව සිය ප්‍රතිපත්තීන්ට එරෙහි සුලු හෝ විවේචනයක් "කොටි ත්‍රස්තවාදීන්ට උදවු කිරීමක්" ලෙස පුරුද්දක් ලෙස ම හෙලා දකියි. එසේ ලේබල් ගැසීමෙන් බියවැද්දීම, චෝදනා නොමැතිව සිරගත කිරීම හා සමහර සිදුවීම් සම්බන්ධයෙන් ගත් කල ආන්ඩු ගැති ඝාතක කල්ලි විසින් අමු අමුවේ සිදු කරන මනුෂ්‍ය ඝාතනවලට, වාතාවරනය නිර්මානය වී ඇත.

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" නමැති ව්‍යාජය සියලු දෙමල වැසියන් "ත්‍රස්තවාදී සැකකරුවන්" ලෙස හංවඩු ගැසීම සඳහා යොදා ගනියි. උතුරේ යුද්ධය අතරතුර පලා ආ 200,000 පමන දෙමල සිවිල් වැසියන් හමුදා භටයන් විසින් රැකවල් ලා ඇති පිලිකුල් සහගත රැඳවුම් කඳවුරු තුලට ගාල් කරනු ලැබ තිබේ. සිවිල් වැසියන්ගේ සියලු මරන, එල්ටීටීඊය විසින් ඔවුන් "මිනිස් පලිහක්" ලෙස යොදාගැනීම නිසා සිදුවීයයි චෝදනා නගමින් ආන්ඩුව, ඇමරිකානු හා ඊස්රායල් ප්‍රචාරනයෙන් නයට ගත් මන්තරය ජප කරයි. එල්ටීටීඊය යටතේ තවමත් ඉතිරිව ඇති කුඩා බිම්කඩක සිරවී සිටින 50,000 යයි ගනන්බලා ඇති සිවිල් ජනතාව වෙත ආහාර හා බෙහෙත් ද්‍රව්‍ය සැපයීම වලක්වන මිලිටරිය, එය යුක්තිසහගත කරන්නේ "ත්‍රස්තවාදීන්ට එය රැකුලක්" වනු ඇතැයි කියාපාමිනි.

ආන්ඩුව හා විරුද්ධ පක්ෂ ද මාධ්‍යයේ සියලු ක්ෂේත්‍රයන් මෙන්ම මිලිටරිය හා රාජ්‍ය නිලධරය ද ඇතුලු පාලක පැලැන්තියේ නිල කරලිය බවට පත්ව ඇත්තේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධ" යි. උතුරේ දිගහැරෙමින් ඇති මානව ව්‍යසනය "කොටි ප්‍රචාරයන්" ලෙස ප්‍රතික්ෂේප කරන අතර, මාධ්‍යයෙහි වාර්තාවන්නේ කලාතුරකිනි. සියලු පක්ෂ මිලිටරිය වීරයන් ලෙස හුවාදක්වමින්, එහි අපරාධ බැහැර කරති. මෙම දුෂ්ඨ ව්‍යාපාරයේ අරමුනවී ඇත්තේ බියගැන්වීම, විවේචනාත්මක කොටස් නිහඬකිරීම හා සියල්ලටත් වඩා කුමන හෝ දේශපාලන විරුද්ධත්වයක් මැඩපැවැත්වීමයි.

යුද්ධයේ සියලු මුල් විහිද ඇත්තේ කම්කරු පන්තිය බෙදීම හා ධනේශ්වර පාලනය සඳහා සමාජ පදනමක් සහතික කර ගැනීමෙහි ලා කොලඹ බලයට පත් සියලු ආන්ඩු විසින් දශක ගනනාවක් තිස්සේ දෙමල විරෝධී වෙනස්කම් කිරීම ගසාකෑමේ ක්‍රියාවලිය තුල ය. එල්ටීටීඊ විනාශ කිරීමේ යුද්ධයෙහි එල්ලය වන්නේ "ත්‍රස්තවාදය" අතුගාදැමීම නොව සිංහල පාලක පැලැන්තියේ බලය හා වරප්‍රසාද තහවුරු කර ගැනීමයි. කොලඹ බලවතුන් සාකච්ඡාවට ගැනීමට අකැමති ඉතිහාසය මෙයයි. එල්ටීටීඊ පාර්ශවයෙන් ගත්කල, වෙනම ධනේශ්වර රාජ්‍යයක් සඳහා වන ඉල්ලීම හා සිංහල සිවිල් වැසියන්ට එල්ල කරන එහි ප්‍රහාර තුඩුදී ඇත්තේ වාර්ගික විභේදනය තවත් පුලුල් කිරීමට පමනි.

බටහිර බලවතුන් සටන් විරාමයක් සඳහා කරන ඉල්ලීම් මධ්‍යයේ මෑත සතිවල දී රාජපක්ෂගේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" විකාර සහගත නැම්මක් ගෙන තිබේ. එක්සත් ජාතීන් හා ඉන්දියාව පසෙකින් තැබුව ද එක්සත් ජනපද, බ්‍රිතාන්‍ය, ප්‍රන්ස, කැනඩා, ඩෙන්මාර්ක් හා කැනඩා විදේශ ලේකම්වරු හා ඉහල පෙලේ රාජ්‍ය නිලධාරීන් එක්කෝ ජනාධිපති සමඟ සෘජුව ම කථාබස්කර හෝ දිවයිනේ සංචාරය කර තිබේ. සිවිල් ජනතාව මුදාගැනීමට ඉඩ සැලසෙන සටන් විරාමයක් සඳහා ඉල්ලීම් ආන්ඩුව විසින් තරයේ ම ප්‍රතික්ෂේප කර දැමුනි.

අධිරාජ්‍ය විරෝධී හැරීමකට ඉඩ සලසමින් එක්සත් ජනපදය හා එහි සගයන් පිලිබඳව ද එම වාර්ගික තර්කනය ම යොදා ගනිමින් තිබේ. පසුගිය සතියේ බ්‍රිතාන්‍ය විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් හා ප්‍රන්ස විදේශ ඇමති බර්නාඩ් කුෂ්නර් ගේ සංචාරය අතර වාරයේ රාජපක්ෂ ප්‍රකාශ කලේ බටහිර බලවතුන් තමන්ට "දේශනා" නොපැවැත්විය යුතු බවය.

ජනාධිපතිගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඩේලි ටෙලිග්‍රාෆ් පත්‍රයට කියා සිටියේ මිලිබෑන්ඩ් හා කුෂ්නර්ගේ සටන් විරාම යෝජනා විහිලුවක් බවය. "200,000 මුදාගැනීම මඟින් මෙම සිවිල් වැසියන් ගලවා ගැනීමට අපට හැකි බව අප ඔප්පුකර ඇත. එසේනම් මෙතරම් විදේශ ඇමතිවරු ගනනකගේ මෙම කැත තදියම කුමක් සඳහා ද? නැවත නැවතත් මෙරටට පැමිනෙන ඉහල පෙලේ නිලධාරීන් හා නියෝජිතයන් සමග සාකච්ඡා කරමින් අපි නිකම් කාලය නාස්ති කරමු. මක්නිසාද යත් ඔවුන්ගේ රටවල සිටින සංක්‍රමනික දෙමල ප්‍රජාව සතුටු කිරීමේ අභ්‍යන්තර ගැටලු වලට ඔවුන් මුහුන දී සිටීම නිසාය" යි ඔහු වැඩිදුරටත් පැවසීය.

පසුගිය සති අන්තයේ දක්ෂිනාංශික සන්ඩේ අයිලන්ඩ් කතුවැකිය ආන්ඩුව ප්‍රශංසාවට ලක් කලේ මෙසේය: "මෑත දිනවල බොහෝ ලෝක බලවතුන් විසින් යොදන ලද පීඩනය හමුවේ ලංකාව කෙලින් සිටියේ ය. මෙය සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අභිමානයට කාරනයක් වනු ඇත." පසුගිය මාසයේ එම පුවත්පතම යුද්ධයට එරෙහිව පැරිසියේදී විරෝධතාවයේ යෙදුනු දෙමල ජනතාවට ප්‍රන්ස ආන්ඩුව සැලකු ආකාරය පිලිබඳව, එරටට පහර දුන්නේය. "ප්‍රන්ස පොලිසිය අවබෝධතාව බිඳ දමන ත්‍රස්ත ක්‍රියාකාරීන් 200 පමනක් අත්අඩංගුවට ගෙන ඇත්තේ මන්ද? ප්‍රසිද්ධියේ ම ත්‍රස්තවාදයට අනුබල දෙමින් උද්ඝෝෂනයේ යෙදුනු සියලු දෙනාම කුඩුවල කොටුකිරීමට සුදුසු නොවන්නේ ද?" කතුවැකියෙහි එසේ සඳහන් විය.

පාලක සභාගයේ කොටස්කරුවෙකු වන ජාතික හෙල උරුමය (ජේඑච්යූ) වැනි සිංහල අන්තවාදී කන්ඩායම් "ත්‍රස්තවාදීන් ගලවාගැනීමට" උත්සාහ කිරීම පිලිබඳව එක්සත් ජනපදයට හා යුරෝපා සංගමයට ප්‍රසිද්ධියේ චෝදනා කරති. ජේඑච්යූ සන්ධානගතව සිටින ත්‍රස්තවාදයට එරෙහි ජාතික ව්‍යාපාරය " ත්‍රස්තවාදයට ආධාර හා අනුබල දීමේ" චෝදනාව එල්ල කරමින්, මිලිබෑන්ඩ්, එ.ජ. රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් හා නෝර්වීජියානු ඇමති එරික් සෝල්හයිම්ගේ ඡායාරූප සහිත "ඕනෑකර තිබේ" යන පෝස්ටර් කොලඹ හා අවට අලවා තිබුනි.

ඊට නොදෙවෙනි පරිද්දෙන් විරුද්ධ පක්ෂයේ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) පසුගිය සතියේදී " සටන් මෙහෙයුම් හා බර අවි යොදාගැනීම අවසන් කිරීමේ" ආන්ඩුවෙහි නිවේදනය හෙලා දුටුවේය. නිවේදනය සුපුරුදු පරිදි ම බොරුවක් වුවත් ඉන් ජාත්‍යන්තර බලපෑම් වලට හිස නැමීම පිලිබඳව රාජපක්ෂට චෝදනා කිරීමෙන් ජවිපෙ වලක්වාලූයේ නැත.

කොලඹ දේශපාලන කරලිය තුල ඉමහත් බලපෑම් සහිත ආරක්ෂක අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් මැයි 5 දින මෙසේ ප්‍රකාශ කලේය: " ඊනියා මානව අයිතීන් පිලිබඳ කප්පිත්තන් ශ්‍රී ලංකා ආන්ඩුව වෙත අභූත ඉල්ලීම් ගනනාවක් ඉදිරිපත් කොට තිබේ. එනම් ත්‍රස්තවාදීන්ට ක්ෂමාව ලබාදීම, ත්‍රස්තවාදී නායකයන් මුදාගැනීමට තුන්වන පාර්ශවයකට ඉඩ සැලසීම, සටන් විරාමයකට එලඹීම යනාදි වශයෙනි. මෑත අවධියකදී ශ්‍රී ලංකාව වෙත බටහිර බලවතුන්ගේ කුහකත්වය හා බොරු ශීලය මෙතරම් පෙන්නුම් කල අවස්ථාවක් ඉතිහාසයෙන් සොයාගත නොහැකිය."

රාජපක්ෂගේ යුද්ධයට පිටුබලය සැපයූ සෑම අධිරාජ්‍යවාදී බලවතෙකුම බොරු සිල් හා කුහකත්වය පිලිබඳව නිසැකව ම දෝෂදර්ශනයට ලක්වේ. සටන් විරාමයක් සඳහා කෙරෙන ඔවුන්ගේ ඉල්ලීම් කිසිසේත්ම දෙමල ජනතාව පිලිබඳ උත්සුකයකින් හටගන්නේ නොවේ. ඊට විපරීතව පවත්නේ, යුද්ධයෙන් ඉක්බිත්තෙහි ඔවුන්ගේ ආර්ථික හා භූ දේශපාලනික අවශ්‍යතාවන් සුරක්ෂිත කර ගැනීමේ උත්සුකයයි.

කෙසේ වුවද කොලඹ සංස්ථාපිතයේ "අධිරාජ්‍ය විරෝධය" මුලුමනින්ම ප්‍රෝඩාවකි. ආන්ඩුවේ හා විරුද්ධ පක්ෂයේ සියල්ලෝම, ඇෆ්ගනිස්ථානයේ හා ඉරාකයේ එක්සත් ජනපද නව යටත් විජිත යුද්ධයන්ට පිටුබලය ලබාදුන්හ. දැන් ඔවුන් එම රටවල අධිරාජ්‍යවාදී අපරාධයන්ට අනියම් ලෙස ඇඟිල්ල දිගු කරන්නේ හා කුහකත්වය ගැන චෝදනා කරන්නේ නම් ඒ, ශ්‍රී ලංකාව තුල තමන්ගේ ම සාපරාධී යුද්ධයට කුමන හෝ ජාත්‍යන්තර මැදිහත්වීමක් නිමාකල යුතු බව කියා සිටීමට පමනි.

ආරක්ෂක අමාත්‍යාංශ නිවේදනය තුල ප්‍රශංසා මුඛයෙන් සඳහන් කල රටවල් ගනනාවක් නම්කර තිබේ. ඉන්දියාව, පකිස්ථානය හා අනෙකුත් දකුනු ආසියානු රටවල් ද චීනය, රුසියාව, ජපානය, ඉරානය, ලිබියාව, වියට්නාමය, මැදපෙරදිග, අප්‍රිකානු හා ගිනිකොනදිග ආසියානු රටවල් ඒ අතරවේ. "අපගේ දුක් ගැනවිලි ගැන ඔවුන්ගේ අවබෝධයත්, අප කෙරෙහි ඔවුන් තැබූ විශ්වාසයත් නොවන්නට අපගේ ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේදී කවර කලෙකවත් අපට මෙතෙක් දුර පැමිනීමට නොහැකිවනු ඇත." එහි ප්‍රකාශිතය. ඉන් පෙනී යන්නේ ජාත්‍යන්තර ප්‍රජාව වඩාත් ස්වාධීන වී ඇති බවත් එබැවින් ශ්‍රී ලංකාව වැනි දුප්පත් රටවල් ඔවුන්ගේ අයිතීන් සඳහා නැඟී සිටීමේ දී වඩා සුරක්ෂිතව ඇති බවත් ය."

ශ්‍රී ලංකා ආන්ඩුව, එන්ට එන්ටම වැදගත් වන මුක්කුකරුවෙක් ලෙස විශේෂයෙන්ම චීනය මත රැඳී සිටියි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල ශ්‍රී ලංකාවේ යුද්ධය පිලිබඳව නිල සාකච්ඡාවක් සඳහාවූ ඉල්ලීමට එය "අභ්‍යන්තර ප්‍රශ්නයක්" යන කාරනය ඉදිරිපත් කරමින් චීනය හා රුසියාව විරුද්ධත්වය පල කලහ. ජපානය පරයා යමින් චීනය ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූල්‍ය ආධාර සැපයුම්කරු වී ඇතුවාක් මෙන්ම ප්‍රහාරක ජෙට්යානා ඇතුලු මිලිටරි ආම්පන්න වැඩිම කොටස සපයන්නා බවට ද පත්ව සිටියි. එයට හිලව් වශයෙන් චීනය, මැද පෙරදිග සිට ඊසාන දිග ආසියාව කරා වැටී ඇති ප්‍රධාන මුහුදු මාර්ගවලට යාබදව, දිවයිනේ දකුනු කොනෙහි පිහිටා ඇති මූලෝපායිකව වැදගත් හම්බන්තොට වරාය ඉදිකිරීමේ අයිතිය හිමිකරගෙන තිබේ.

රාජපක්ෂගේ යුද්ධය සඳහා චීනයේ රුසියාවේ හා පකිස්ථානයේ අවිචේචනාත්මක සහාය මෙන්ම ඉන්දියාව හොර රහසේ දෙන පිටුබලය ද මඟින්, පැහැදිලිව ම සිංහල අන්තවාදී පක්ෂ හා ශ්‍රී ලංකා සංස්ථාපිතය තුල මිලිටරිවාදී කොටස් ශක්තිමත්වී තිබේ. ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රකාශය තුල අනාගතයේදී ශ්‍රී ලංකාව චීනය දෙසට වඩාත් නැඹුරු විය හැකි බවට එක්සත් ජනපදය හා එහි මිත්‍ර පාර්ශවයට කෙරෙන අනතුරු ඇඟවීමක් ගැබ්ව ඇත. ස්ථාපිත මිලිටරි බලයක් ලෙස එල්ටීටීඊ විනාශවීමත් සමඟ ආන්ඩුව, එහි අඩමාන බලාධිකාරය සවිමත්කර ගැනීමෙහි ලා ප්‍රධාන බලවතුන් අතර කෙරෙන එහි උපාමාරු දැමීම්වල දිගට ම නිරතවනු ඇත.

කොලඹ තුල සිදුවෙමින් ඇති වාර්ගික උද්ඝෝෂන ප්‍රධාන කොට ම යොමුව ඇත්තේ "බටහිර බලවතුන්" වෙත නොව කම්කරු පන්තිය හා පීඩිත ජනතාවන්ට එරෙහිව ය. අතොරක් නැතිව සිදුවන මෙම උද්ඝෝෂන මුරය මධ්‍යයේ පවා, සමස්ත පරම්පරාවකට ම වින කොට ඇති හා 75,000 අධික ජීවිත බිලිගත්, සියවස් කාලක් පුරා දිග් ගැස්සී ඇති යුද්ධය සඳහා, පුලුල්ව පැතිරුනු ජනතා සහයෝගයක් ඇත්තේ නැත. සාමාන්‍ය ජනතාවට විඳීමට බලකෙරී ඇති ගනන් නැති මානව ව්‍යසනයන් හා දුක් ගැහැටවලට තුඩු දුන් ගැටුම මඟින් නිර්මානය කර ඇත්තේ කෝපය හා විරුද්ධත්වයයි.

ගෝලීය පසුබෑමෙන් උග්‍ර කෙරී ඇති යුද්ධයේ සමස්ත වියදම ජනතාවගේ කර පිට පටවා ඇති තතු හමුවේ, පුපුරා යාමට නියමිතව ඇති මහජන කෝපය හා පන්ති අරගල අවමංගත කිරීමෙහි ලා වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රයන් හා ඊනියා වමේ පක්ෂ සැහෙන්නේ නැති බව රාජපක්ෂ ආන්ඩුව හොඳකාරව වටහාගෙන සිටියි.

වත්මනෙහි පවත්වා ගෙන යන උන්මාදය, කම්කරු පන්තියට එරෙහි නව ආර්ථික ප්‍රහාරයක් මුදාහැරීමේදී යොදාගන්නවා ඇති ක්‍රමවේදයන් පිලිබඳ තියුනු අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතුය. අලුත් " ත්‍රස්තවාදීන් වනු ඇත්තේ වැඩ වර්ජනය කරන කම්කරුවන්, විරෝධතාවයේ යෙදෙන සිසුන් හා ගොවීන්ය. කලින් දෙමල ජනතාවට එරෙහිව ක්‍රියාවට නැගූ පොලිස් රාජ්‍ය මර්දනය සමස්තයක් ලෙස කම්කරු පන්තිය වෙත හරවනු ඇත. සමාජවාදී ජාත්‍යන්තරවාදය මත පදනම්වූ නව මහජන පක්ෂයක් ගොඩනැඟීම මඟින් පමනක්, වැඩ කරන ජනතාවට සිය මූලික ප්‍රජාතන්ත්‍රීය හා සමාජ අයිතීන් රැකගත හැකිවනු ඇත.

© www.wsws.org